# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2003 අංක 13 දරන කාර්මික ආරාවුල් (නඩු කටයුතු විභාග කිරීමේ සහ විනිශ්චය කිරීමේ) (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 8.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2003 අංක 13 දරන කාර්මික ආරාවුල් (නඩු කටයුතු විභාග කිරීමේ සහ විනිශ්චය කිරීමේ) (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින]

එල්. ඩී.-ඕ. 53/2002.

**කාර්මික ආරාවුල් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සහ යොමු කිරීම් කඩිනමින් විභාග කිරීම සහ තීරණය කිරීම සඳහා ද ; කාර්මික ආරාවුල් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ කරුණු සඳහා හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

කාර්මික ආරාවුල් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සහ යොමු කිරීම් සම්බන්ධයෙන් ඉතා කෙටි කාලයක් තුළ දී තීරණ ලබා ගැනීමට ඒ ඉල්ලීම් සහ යොමු කිරීම්වලට අදාළ පාර්ශ්වයන්ට හැකිවනු පිණිස ඒ ඉල්ලීම් සහ යොමු කිරීම් පිළිබඳව කඩිනමින් සුදුස්සක් කිරීම සහතික කරවා ගැනීම අවශ්‍ය වී ඇති හෙයින් ද : පූර්විකාව.

එසේ කඩිනමින් සුදුස්සක් කිරීම පහසු කිරීම සඳහා කම්කරු විනිශ්චය අධිකාර සහ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සහ තීරකවරයකු වෙත ඉදිරිපත් කරනු ලබන යොමු කිරීම් තීරණය කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ ඒ ඉල්ලීම් මත ප්‍රකාශකර ඇති ආඥාවලට එරෙහිව ඉදිරිපත් කර ඇති අභියාචනා විභාග කිරීම සහ තීරණය කිරීම සම්බන්ධයෙන් කාලසීමා නියම කිරීම අවශ්‍ය බවට සලකනු ලබන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2003 අංක 13 දරන කාර්මික ආරාවුල් (නඩු කටයුතු විභාග කිරීමේ සහ විනිශ්චය කිරීමේ) (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන්නා වූ ද දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2--H 16854—4,500 (2002/10)

කම්කරු විනිශ්චය අධිකාර ඉදිරිපිට තවු කටයුතු තීරණය කිරීම.

සහකාර ලේකම්වරයා විසින් ඉල්ලීමේ පිටපතක් සේවා යෝජකයා ආදීන්ට ඉදිරිපත් කළ යුතු බව.

**2.** (1) කාර්මික ආරාවුල් පනතේ 31 ආ වගන්තිය යටතේ ඉල්ලීමක් කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ලැබීමෙන් අනතුරුව ඒ ඉල්ලීම නියමිත ආකෘතියකට අනුව ඇත්නම්, අප්‍රමාදව සහ කෙසේ වෙතත් ඒ ඉල්ලීම ලැබුණු දින සිට වැඩකරන දින තුනක් ඇතුළත, ඒ ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ යම් සේවායෝජකයකු සම්බන්ධයෙන් ද ඒ සේවායෝජකයා වෙත එහි පිටපතක් ඉදිරිපත් කිරීම ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සහකාර ලේකම්වරයාගේ කාර්යය වන අතර, සහකාර ලේකම්වරයා විසින් සේවායෝජකයා වෙත යවන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීම ලැබී දින විසි එකක් ඇතුළත ඒ ඉල්ලීමට අදාළ වන කරුණුවට තම පිළිතුර දක්වන ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුක්තව සහකාර ලේකම්වරයා වෙත එවිය යුතු බවට ඒ සේවායෝජකයාට නියම කරනු ලැබිය යුතු ය. නියම කර ඇති ප්‍රකාශය පිටපත් දෙකකින් යුක්තව අදාළ කාලසීමාව ඇතුළත සහකාර ලේකම්වරයා වෙත යැවීම සේවායෝජකයාගේ කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය ලැබූ දින සිට වැඩ කරන දින තුනක් ඇතුළත ඒ ප්‍රකාශයේ පිටපතක් ඉල්ලුම්කරුට යැවීම සහකාර ලේකම්වරයාගේ කාර්යය වන අතර සහකාර ලේකම්වරයා විසින් ඉල්ලුම්කරු වෙත යවන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීම ලැබූ දින සිට දින විසිඑකක් ඇතුළත ඒ ප්‍රකාශයට ඉල්ලුම්කරුගේ පිළිතුර සඳහන් කරනු ලබන ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුක්තව ඔහු වෙත ඉදිරිපත් කරන ලෙසට ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය යුතු ය.

නියම කර ඇති ප්‍රකාශය පිටපත් දෙකකින් යුක්තව අදාළ කාලසීමාව ඇතුළත සහකාර ලේකම්වරයා වෙත යැවීම ඉල්ලුම්කරුගේ කාර්යය වන්නේ ය.

(3) කම්කරු විනිශ්චය අධිකාරය විසින් වාර්තාගත කළ යුතු අති විශේෂ හේතු සඳහා මිස, (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් කාලසීමාවන් සඳහා දීර්ඝ කිරීමට අවසර නොදීම කම්කරු විනිශ්චය අධිකාරයක කාර්යය වන්නේ ය.

(4) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්කරු විසින් එවන ලද ප්‍රකාශය ලැබීමෙන් අනතුරුව, අප්‍රමාදව සහ කෙසේ වෙතත් එම ප්‍රකාශය ලැබී වැඩ කරන දින තුනකුට

නොවැඩි කාලයක් ඇතුළත ඒ ඉල්ලීම විභාගය සඳහා නියම කොට, ඒ එසේ නියම කළ දිනය පිළිබඳව ඉල්ලීමට අදාළ සියලු පාර්ශ්වකරුවන් වෙත දැන්වීමක් මගින් දැනුම් දීම කම්කරු විනිශ්චය අධිකාරයේ කාර්යය වන්නේ ය.

(5) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ නියම කර ඇති ප්‍රකාශයන් යැවීම අවස්ථාවෝචිත පරිදි සේවායෝජකයා හෝ ඉල්ලුම්කරු විසින් පැහැර හරින අවස්ථාවක, අප්‍රමාදව සහ කෙසේ වෙතත් එසේ පැහැර හැරීමේ දින සිට වැඩ කරන දින තුනකට නොවැඩි කාලයක් ඇතුළත ඒ ඉල්ලීම් විභාගය සඳහා නියම කොට, ඒ එසේ නියම කළ දිනය පිළිබඳව ඉල්ලීමට අදාළ සියලු පාර්ශ්වකරුවන් වෙත දැන්වීමක් මගින් දැනුම් දීම කම්කරු විනිශ්චය අධිකාරයේ කාර්යය වන්නේ ය.

යම් පාර්ශ්වයක් පැමිණ නොසිටින විටක දී කම්කරු විනිශ්චය අධිකාරයට නඩු කටයුතු පවත්වාගෙන යා හැකි බව.

3. කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට ඇති ඉල්ලීමක පාර්ශ්වකරුවකු ප්‍රමාණවත් හේතු නොදක්වා එම අධිකාරය වෙත පැමිණීම පැහැර හරින්නේ නම් හෝ ඒ විනිශ්චය අධිකාරයේ යම් විභාග කිරීමේ දිනයක දී ඔහු වෙනුවෙන් නියෝජනයක් නොමැති නම්, ඒ පාර්ශ්වය පැමිණ නොසිටීම හෝ ඒ පාර්ශ්වය වෙනුවෙන් යම් නියෝජිතයකු නොසිටීම නොතකා, කම්කරු විනිශ්චය අධිකාරය විසින් ඒ කරුණ පිළිබඳව විභාග කොට තීරණය කරනු ලැබිය හැකි ය.

නඩු විභාග කල් දැමීම සඳහා අවසර දෙනු නොලබන බව.

4. යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් විභාගය සඳහා නියම කරනු ලැබ ඒ විභාග්‍ය පිළිබඳ දැන්වීම ඉල්ලීමට අදාළ පාර්ශ්වකරුවන් වෙත ලබා දී ඇති අවස්ථාවක දී, කම්කරු විනිශ්චය අධිකාරය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසන් වනතුරු නොකඩව දිනපතාම විභාග කරගෙන යා යුතු අතර, ඒ කම්කරු විනිශ්චය අධිකාරය විසින් වාර්තාගත කළ යුතු විශේෂ හේතු සඳහා මිස, ඒ විභාගය කිසිදු ආකාරයකින් කල්දැමීමට අවසර නොදිය යුතු ය.

ඉල්ලීම් සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය අධිකාරවල බලතල සහ කාර්යය.

5. (1) ඉල්ලීමක් කරනු ලැබ ඇත්තේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ද ඒ කම්කරු විනිශ්චය අධිකාරය විසින් සාධාරණ සහ යුක්ති සහගත බවට ඒ කම්කරු විනිශ්චය අධිකාරයට පෙනී යන ආඥාවක් කිරීමත්, ඒ ඉල්ලීම සම්බන්ධව අධිකාරය විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු පරීක්ෂණ පැවැත්වීමත්, සියලු සාක්ෂි විභාග කිරීමත් කම්කරු විනිශ්චය අධිකාරයේ කාර්ය වන අතර, ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දින සිට මාස හතරකට නොවැඩි කාලයක් ඇතුළත ඒ ආඥාව කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව, විවෘත විනිශ්චය අධිකාරයේ දී භාර දෙනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන දිනය පිළිබඳ දැන්වීම, අධිකාරයේ සහකාර ලේකම්වරයා විසින්, ඉල්ලීමට අදාළ සියලු පාර්ශ්වයන් වෙත ලබා දිය යුතු ය.

(4) කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරනු ලබන ආඥාවක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අභියාචන හෝ ප්‍රතිශෝධන ඉල්ලීම් විභාග කිරීම සහ ඒවායේ තීරණ.

6. (1) කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරනු ලබන ආඥාවකට එරෙහිව කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අභියාචන පෙත්සමක් (අභියාචනය කරනු ලැබුවේ යම් ආඥාවකට එරෙහිව ද ඒ ආඥාව කරනු ලැබූ දිනය ද ඇතුළුව එහෙත් ඉරිදා දින සහ පෝය දිනයන් හැර) ආඥාව කරනු ලැබූ දින සිට දින තිහක කාලයක් ඇතුළත ගොනු කරනු ලැබිය යුතු ය.

(2) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවකට එරෙහිව කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් හෝ ප්‍රතිශෝධන ඉල්ලීමක්, ඒ අභියාචනය හෝ ඉල්ලීම ගොනු කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

31ඇ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන රිට් ආඥාවක් සඳහා වූ ඉල්ලීමක් සහ එවැනි ඉල්ලීමක් මත නිකුත් කරන ලද යම් ආඥාවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් මාස හතරක් ඇතුළත විභාග කොට තීරණය කරනු ලැබිය යුතු බව.

7. (1) කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා විසින් කරන ලද යම් ආඥාවක් සම්බන්ධයෙන් ඒ සභාපතිවරයාට එරෙහිව සර්ටියෝරාරි, තහනම්, ප්‍රසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, අභියාචනාධිකරණය වෙත ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත ඒ මහාධිකරණය හෝ අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ඉල්ලීමක් මත අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් ඒ

ආඥාව ලැබූ දින සිට එක් මාසයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත ඒ අභියාචනය විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ මහාධිකරණ ආඥාවකට එරෙහිව කාර්මික ආරාවුල් පනතේ 31ඇඇ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක්, ඒ අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කරනු ලැබූ දින සිට මාස හතරක් ඇතුළත් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

*31 ඇඇ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචන මත දෙනු ලබන තීරණ.*

9. මේ පනත යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට නඩු කටයුතු පවත්වාගෙන යාමේ දී සාක්ෂි ආඥාපනතේ විධිවිධාන ඊට අදාළ නොවන්නේ ය.

*සාක්ෂි ආඥා පනත අදාළ නොවිය යුතු බව.*

10. මේ පනත යටතේ නිකුත් කරනු ලබන දැන්වීමක්, ඉල්ලීමක් හෝ වෙනත් ලේඛනයක් යම් තැනැත්තකුට භාර දීම, අතින් භාර දීම මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීම මගින් හෝ ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි ස්ථානයේ ඇතුලුවන දොරටුවෙහි ඒ දැන්වීම, ඉල්ලීම හෝ වෙනත් ලේඛනය ඇලවීමෙන් හෝ සිදු කළ යුතු ය.

*මේ පනත යටතේ දැන්වීම්, ඉල්ලීම් ආදිය භාර දීම.*

**කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් පිළිබඳව තීරණය කිරීම.**

11. කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ යම් කම්කරුවකුගේ උපලේඛනගත රක්ෂාව අවසන් කිරීමට සේවායෝජකයකුට අනුමතය ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා කොමසාරිස්වරයා හට ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, සේවායෝජකයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම ලැබීමේ දින සිට මාස දෙකක් ඇතුළත ස්වකීය නියමය කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

*කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක්, ඉල්ලීම කිරීමෙන් මාස දෙකක් ඇතුළත කළ යුතු බව.*

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තිය යටතේ වූ නියමයක් ඉල්ලීම කිරීමෙන් මාස දෙකක් ඇතුළත කළ යුතු බව.

**12.** කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තිය යටතේ නියමයක් සඳහා කම්කරුවකු විසින් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, කම්කරුවා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම ලැබීමේ දින සිට මාස දෙකක් ඇතුළත ඒ නියමය කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6අ වගන්තිය යටතේ වූ නියමයක් ඉල්ලීම කිරීමෙන් මාස දෙකක් ඇතුළත කළ යුතු බව.

**13.** කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කම්කරුවකුට වන්දි ගෙවීමට අදාළව කොමසාරිස්වරයා විසින් කළ යුතුව ඇති නියමය, කම්කරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම ලැබීමේ දින සිට මාස දෙකක් ඇතුළත සිදු කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

### තීරකයකු වෙත ඉදිරිපත් කරන ලද යොමු කිරීම් පිළිබඳ තීරණය කිරීම

කාර්මික ආරාවුල් පනත යටතේ කරන ලද යොමු කිරීමක් සම්බන්ධයෙන් තීරකයකු විසින් ප්‍රදානයක් කිරීම මාස තුනක් ඇතුළත කළ යුතු බව.

**14.** කාර්මික ආරාවුල් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ හෝ එම පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කාර්මික ආරාවුලක් බේරුම් කිරීම සඳහා තීරකයකු වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක දී ඒ පනතේ 17 වන වගන්තිය යටතේ ස්වකීය ප්‍රදානය කිරීම, ඒ යොමු කිරීම සිදු කළ දින සිට මාස තුනක් ඇතුළත සිදු කිරීම, ඒ තීරකයාගේ කාර්යය වන්නේ ය:

කෙසේ වුවද, ඉහත සඳහන් කාලය ඇතුළත බලාත්මක බේරුම්කරණයක් කිරීමට නොහැකි යයි බේරුම්කරුගේ මතය වන්නේ නම්, ඒ සඳහා තවත් මාස දෙකක කාලයක් තුළ ප්‍රදනය කිරීම නීත්‍යානුකූල වන අතර, එවැනි අවස්ථාවක දී එසේ කිරීමට හේතු වාර්තා ගත කළ යුතුය.

### කාර්මික ආරාවුල් පනත යටතේ කරනු ලබන ප්‍රදාන හෝ ආඥා අර්ථ නිරූපණය කිරීම සඳහා කරන ඉල්ලීම්

කාර්මික ආරාවුල් පනතේ 34 වන වගන්තිය යටතේ කරන ලද යොමු කිරීමක් ආඥාවේ හෝ ප්‍රදානයේ දින සිට එක් මාසයක් ඇතුළත කළ යුතු බව.

**15.** අවස්ථාවෝචිත පරිදි තීරකයකු, කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ කාර්මික අධිකරණයක් විසින් කරනු ලබන යම් ප්‍රදානයක් හෝ ආඥාවක් අර්ථ නිරූපණය කිරීමට අදාළව කාර්මික ආරාවුල් පනතේ 34 වන වගන්තිය යටතේ කරනු ලබන යොමු කිරීමක්, ඒ ප්‍රදානය හෝ ආඥාව සිදු කළ දින සිට

එක් මාසයක් ඇතුළත සිදු කළ හැකි අතර, ඒ යොමු කිරීම ලැබීමේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ යොමු කිරීම විභාග කොට නිශ්චය කිරීම, අවස්ථාවෝචිත පරිදි, ඒ යොමු කිරීම අර්ථ නිරූපණය සඳහා ඉදිරිපත් කරනු ලැබූ තීරකයාගේ, කම්කරු විනිශ්චය අධිකාරයේ හෝ කාර්මික අධිකරණයේ කාර්යය වන්නේ ය.

### විභාග වෙමින් පවත්නා නඩු පිළිබඳව තීරණය කිරීම

විභාග වෙමින් පවත්නා නඩු කටයුතු.

**16.** (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී කාර්මික ආරාවුල් පනතේ 31ආ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ විභාග වෙමින් පවත්නා අවස්ථාවක දී, ඒ ඉල්ලීම පිළිබඳ සියලු පරීක්ෂණ පවත්වා අධිකාරය විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු සාක්ෂි විභාග කොට, ඉන්පසු මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාස හතරකට නොවැඩි කාලයක් ඇතුළත, සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකාරයට පෙනී යන ආඥාවක් කරනු ලැබීම ඒ අධිකාරයේ කාර්යය වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන, 6 වන හෝ 6අ වන වගන්ති යටතේ කොමසාරිස්වරයා ඉදිරිපිට යම් නඩු කටයුත්තක් විභාග වෙමින් පවතින අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වන දින සිට එක් මාසයකට නොවැඩි කාලයක් ඇතුළත ඒ නඩු කටයුත්ත පිළිබඳව ඒ වගන්ති යටතේ ස්වකීය තීරණය ලබා දීම, ඒ කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, කාර්මික ආරාවුල් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ ඒ පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ කරන ලද යොමු කිරීමක් මත තීරකයකු ඉදිරිපිට පරීක්ෂණයක් විභාග වෙමින් පවතින අවස්ථාවක, ඒ තීරකවරයා විසින්, මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාස දෙකකට නොවැඩි කාලයක් ඇතුළත, ඒ යොමු කිරීම මත ස්වකීය ප්‍රදානය කළ යුතු ය.

අර්ථ නිරූපණය.

**17.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි –

"කොමසාරිස්වරයා" යන්නට, කාර්මික ආරාවුල් පනතේ ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"කාර්මික ආරාවුල් පනත" යන්නෙන්, (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත අදහස් වේ ;

"කාර්මික ආරාවුල" යන්නට, කාර්මික ආරාවුල් පනතේ ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"කම්කරු විනිශ්චය අධිකාරය" යන්නෙන්, කාර්මික ආරාවුල් පනතේ 31අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් අදහස් වේ ;

"උපලේඛනගත රක්ෂාව" සහ "කම්කරුවා" යන වචන වලට, කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය ; සහ

"කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත" යන්නෙන්, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.